# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## ණය අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලියකියවිලි.

### නිවසක් ඉදිකිරීම සඳහා

**ණය අංශය සඳහා**

01) පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් සමඟ .අනුමැතිය අවශ්‍ය නොවේ නම් , ඒ බැව් සඳහන් කරමින් ,පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරන ලද ලිපියක්.

02) ආදායම් පිලිබඳ සාක්ෂි :

(අ )ඔබගේ ආදායම වැටුප් අදායමක් නම් , සේවා කාලය , ලබන දළ වැටුප , අඩු කිරීම් හා ශුද්ධ වැටුප සහතික කරමින් , සේවා යෝජකගෙන් ලබාගත් ලිපියක් සහ පසුගිය මාස 06 සඳහා වැටුප් කුවිතාන්සි ( PAYSHEETS)

(ආ ) ව්‍යාපාරවලින් ලැබෙන ආදායමක් නම් , ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් , පසුගිය අවු . 03 සඳහා මූල්‍ය ප්‍රකාශන , අදායම් බදු ගෙවන්නේ නම්,පසුගිය අවුරුදු 03 සඳහා බදු ගෙවූ රිසිට්පත් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ගිණුම් ප්‍රකාශන

(ඇ) ආදායම ලබන්නේ කෘෂිකාර්මික දේපළ වලින් නම් , එම දේපළ වලට අදාළ ඔප්පු පිටපතක් සහ දේශීය අදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ගිණුම් ප්‍රකාශන .

(ඈ) කුලී ආදායමක් නම් අදාළ කුලී ගිවිසුම් සහ එම ආදායම සම්බන්ධ දේපළ / වාහන වල හිමිකම ඔප්පු කිරීම සඳහා ලිපි ලේඛන .

(ඉ) ආදායම ලබන්නේ නම් විදේශ රැකියාවක් නම් , සේවා ගිවිසුම් පිටපතක් ,සේවා කාලය හා ලබන වැටුප සනාථකරමින් , සේවායෝජකගෙන් ලබාගත් ලිපියක් ,පසුගිය මාස 06 සඳහා වැටුප් කුවිතාන්සි. (PAYSHEETS ) වැටුප බැර වන බැංකු ගිණුමේ මාස 06 කා ගිණුම් ප්‍රකාශය ,ශ්‍රී ලංකාවට මුදල් එවීම සඳහන් කරන ගිණුම් ප්‍රකාශන,පාස්පෝර්ට් සහ වීසා වල සහතික කල පිටපතක්.

03) පසුගිය මාස 06 සඳහා බැංකු ප්‍රකාශන .

04) ඉදිකිරීම සඳහා යෝජිත නිවසේ ඇස්තමේන්තුව .

මුළු ඇස්තමේන්තුව රු. 1,500,000 ඉක්මවන විට මෙය වරලත් වාස්තු විද්‍යාඥයෙකු , සිවිල් ඉංජිනේරුවෙකු හෝ ප්‍රමාණ සමීක්ෂකයෙකු විසින් අනුමත කළ යුතුය.

05) මානක සැලැස්මේ වායා පිටපතක් ( වසර 20ක් නොඉක්මවූ පළාත් පාලන ආයතනයෙන් අනුමත කරන ලද ) සහ බිම් කට්ටි සැලැස්මේ පිටපතක් (ඇත්නම්)

06) හිමිකම් ඔප්පුවේ පිටපතක් .

07) ඉදිකිරීම කරන්නේ - ඇපයට තැබූ දේපළ හැර වෙනත් දේපලක් නම් එම දේපළ වලට අදාළ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුය .

1. සින්නක්කර ඔප්පුවේ වායා පිටපතක්.
2. මානක සැලැස්මේ පිටපතක් .
3. ඉඩමට යන මාර්ගයෙහි කටු සටහන

(08) වීථිරේඛා සහතිකයෙහි වායා පිටපතක්.

(09) අයදුම්කරු / වන්ගේ ජාතික හැඳුනුම්පතෙහි / පත්වල පැහැදිලි වායා පිටපත

(10) අයදුම්කරු/ වන්ගේ වායාරූපයක් (2"*2 ½ )" ප්‍රමාණයේ )

(11) විවාහ සහතිකයේ පිටපතක් . (විවාහක නම්)

(12) ඇප දේපළට ළඟාවන මාර්ග සටහන.

**නීති අංශය සඳහා**

(1) හිමිකම් ඔප්පුව /ඔප්පු (මුල් පිටපත /පත් ) සමඟ වායාපිටපතක් .

(2) ඉඩමේ මානක සැලැස්මේ මුල් පිටපත .(අවු. 20 කට වඩා පැරණි නොවිය යුතුයි.)

(3) ඉඩම් රෙජිස්ටාර්තුමා විසින් සහතික කරන ලද ඉඩම් ලියාපදිංචි කාර්යාලයෙන් ගත් අවු.20 සඳහා වූ බැඳීම් පිලිබඳ පත් ඉරු .(මුල් පිටපත)

(4) ඇටර්නි බලපත්‍රය අදාළ නම් (මුල් පිටපත)

(5) ඇපයට තැබූ දේපළට අදාළ පෙර ඔප්පු /සැලසුම් තිබේ නම් ඒවා .

(6) ඇප දේපළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහතික කරමින් ග්‍රාම නිලධාරිතුමාගෙන් ලබාගත් ලිපියක්.

**පහත සඳහන් ලියවිලි ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයකින් ලබා ගත යුතුය.**

07) හිමිකම් සහතිකය

08) වීථි රේඛා සහතිකය (මුල් පිටපත )

09) නොපවරාගැනීමේ සහතිකය (මුල් පිටපත)

10) අන්තිම කාර්තුව සඳහා වරිපනම් බදු කුවිතාන්සිය (මුල් පිටපත)

11) වරිපනම් දැන්වීම (මුල් පිටපත)

CDR 03

මහත්මයාණෙනි/මහත්මියනි ,

ණය ලිපිගොනු අංක

ඉහත අංක දරණ ණය ලිපිගොනුවට අදාළ උකස් ඔප්පුව පිළියෙළ කිරීම සඳහා ඇප දේපළ පිහිට ඇති ග්‍රාම නිලධාරී වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දක්වන ලිපියක් අවශ්‍ය බැවින් පහත සඳහන් පෝරමය ග්‍රාම නිලධාරී මහතා මඟින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

මෙම සහතිකය ලබා ගැනීම සඳහා කරුණාකර ඔප්පුවේ පිටපතක් සමඟ මිනින්දෝරු සැලැස්මේ පිටපතක් රැගෙන යා යුතුය.

මෙයට විශ්වාසී,

ප්‍රධාන කළමනාකාර/කළමණාකාර /සහකාර කළමනාකරණ(නීති)

සහකාර සාමාන්‍යාධිකාරිනී(නීති)

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ගාලුපාර,

කොළඹ 03.

**<u>ඉඩමේ පිහිටීම සහතික කිරීම</u>**

**........................................... වන අයට අයත්**